# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

*විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපනය කිරීම සඳහා යෝජිත ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් මහජනතාවගෙන් අදහස් විමසීම.*

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්තව්‍යයන් සම්බන්ධයෙන් නියාමන ආයතනය වශයෙන් කටයුතු කිරීම සඳහා 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවනු ලැබීය. නියාමන ක්‍රියාවලිය විධිමත්ව සකස් කිරීම තුලින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනය සහතික කිරීමට ඉවහල් වන කාර්යභාරයන් හා වගකීම් නිසි පරිදි ඉටුකර ඇත. සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින වෙළඳපොළ තරඟකාරීත්වය නිසා ඇති වී තිබෙන අභියෝගවලට සාර්ථකව ප්‍රතිචාර දක්වමින් පොදුජන යහපත උදෙසා අවශ්‍ය වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආයතනයට පැවරී ඇති වගකීම් සම්භාරය අති විශිෂ්ඨ හා සාර්ථක අන්දමින් ඉටුකරනු ලබන බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත.

මෑත භාගයේදී විදුලි සංදේශ ජාලයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවීමත් සමග විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු සහ ඊට සම්බන්ධ ජාල පද්ධති ස්ථාපනය කිරීම හා ඒ කෙරෙහි මහජනතාව උනන්දුවක් දක්වන කරුණු වන සෞඛ්‍ය, ආර්ථික, පාරිසරික හා වෙනත් කරුණු කෙරෙහි පූර්ණ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවබෝධ කොටගෙන ඇත. විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම වෙනුවෙන් වූ යෝජනා මගින් විදුලි සංදේශ සේවාවන්හි පවතින අනවශ්‍ය සීමා අවම කර මහජන යහපත උදෙසා පාරිසරික සුරක්ෂිත වන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

එහි සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම සම්බන්ධයෙන් පූර්ණ අවධානය යොමු කොට, හඳුනාගත් ගැටළු සඳහා සාර්ථක විසඳුම් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පත් කරන ලද තාක්ෂණික උපදේශන කමිටුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත.

***ප්‍රතිපත්ති ප්‍රකාශය I*** - විදුලි සංදේශ (සම්ප්‍රේෂණ) කුළුණු පොදුවේ භාවිතය

විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු ජාලයෙන් සැලසෙන සේවාවන් සැමට සමසේ බෙදීයනසේ සහයෝගිතා පදනමක් මත ඵලදායීව උපයෝගී කොට ගත යුතුය. මේ අනුව හඳුනාගත් විදුලි සංදේශ (ඇන්ටෙනා) කුළුණු සවි කිරීමට යෝග්‍ය භූමි ප්‍රදේශයක (ඇන්ටනා පද්ධති භූමිය, Antenna Structure farm) එහි තාක්ෂණික අවශ්‍යතාවන් සපුරාලිය හැකිවන පරිදි සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු අවම සංඛ්‍යාවක් ස්ථාපනය කිරීම අනුමත කරනු ලැබේ.

එක් විදුලි සංදේශ සේවා සපයන්නෙකුට සීමා නොවී එවැනි සේවා සපයන්නන් වැඩි සංඛ්‍යාවකට ප්‍රතිපාදන සැලසෙන පරිදි සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු නිර්මාණය කොට ඉදිකල යුතුය. දිරිගැන්වීමේ යෝජනා මගින් එවන් පොදු ඉදිකිරීම් සඳහා අවශ්‍ය උනන්දුව වැඩි කරනු ලැබේ. විදුලි සංදේශ සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ස්ථාපනය කර ඇති ක්ෂේත්‍රයක් තුළ (ඇන්ටනා පද්ධති භූමිය, Antenna Structure farm) විද්‍යුත් චුම්බක ගුවන්විදුලි තරංග විමෝචනය කිරීමේ සමුච්චිත මට්ටම අයනීකරණය නොවන තරංග පිලිබඳව ජාත්‍යන්තර කොමිෂන් සභාව (ICNIRP) විසින් නියම කර ඇති පරිදි පවත්වාගෙන යායුතු වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එම පිලිවෙත අනුගමනය කොට ක්‍රියාත්මක කළ යුතුය.

විදුලි සංදේශ යටිතල පහසුකම් සැපයීම සඳහා නව සැපයුම්කරුවන්ට විදුලි සංදේශ සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ඉදිකිරීම සඳහා උනන්දු කරනු ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි නිශ්චිත කාලසීමාවන් තුල සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ඉදිකිරීමේ කටයුතු නිම කල යුතුය. සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතිවලට අදාල විශේෂ ගැටළු පිළිබඳව අවධානය යොමු කොට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තාක්ෂණික උපදේශක කමිටුවක් පත්කරනු ලැබේ.

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති අනුමත කිරීමේ අධිකාරි බලය හුදෙක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුව පවතිනු ඇත.

### ***ප්‍රතිපත්ති ප්‍රකාශය II*** - උස මට්ටම නියම කිරීම (නිර්ණයනය කිරීම)

ගුවන් ගමනාගමනයට බාධාවක් නොවන අයුරින් විදුලි සංදේශ කුළුණු ස්ථාපනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ නිර්දේශ සලකා බැලීමෙන් පසුව රට අනුකූලවන පරිදි සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතිවලට අදාල උපරිම උස මට්ටම තීරණය කරනු ලැබේ.

### ***ප්‍රතිපත්ති ප්‍රකාශය III*** - අකුණු ආරක්ෂණ විධිවිධාන

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පරිශ්‍රයේ අකුණු ආරක්ෂණ පද්ධතියක් යෙදීමෙන් ජීවිත හා උපකරණවලට ඇතිවිය හැකි අනතුරුදායක තත්වයන් වලක්වා ගත යුතුය..

ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලවන පරිදි සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති සන්නායක හා භූ ගත කිරීම් මගින් රට ආසන්නව ජීවත්වන මහජනතාවගේ අකුණු සම්බන්ධ ආරක්ෂාව තහවුරු කළ යුතුය. සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති සඳහා අකුණු ආරක්ෂණ පද්ධති සවි කිරීම සහ නඩත්තු කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය. ඉහත සඳහන් පරිදි අංග සම්පූර්ණ අකුණු ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළද අනපේක්ෂිත පරිදි කලාතුරකින් සිදුවිය හැකි අකුණු හානි සඳහා රක්ෂණ ආවරණ වැටසටහනක් ක්‍රියාත්මක කළ යුතුය.

### ***ප්‍රතිපත්ති ප්‍රකාශය IV*** - විද්‍යුත් චුම්බක තරංග සහ මහජන සෞඛ්‍යය

ගුවන්විදුලි තරංග විමෝචනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි සම්ප්‍රේෂණ උපකරණ සවිකල යුතුය. අයනිකරණය නොවන තරංග පිළිබඳව ජාත්‍යන්තර කොමිෂන් සභාව නියම කර ඇති හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ප්‍රමිතීන්ට අනුව ගුවන්විදුලි තරංග ශක්ති ඝණත්වයෙන් යුක්ත බවට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වග බලා ගත යුතුය.

මහජන සෞඛ්‍ය තහවුරු කිරීම සඳහා ගුවන්විදුලි තරංග විමෝචනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විමර්ශණය සිදුකල යුතුවේ.

***ප්‍රතිපත්ති ප්‍රකාශය V*** - පාරිසරික ඇගයීම

අදාල පාරිසරික ආයතනවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුලින් එම ප්‍රදේශයේ ස්වභාවික පරිසරය සුරක්ෂිත කිරීමට කටයුතු කරනු ලැබේ.

**ප්‍රතිපත්ති ප්‍රකාශය VI** - සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ඉදිකිරීම.

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතිවල උස මට්ටම අනුව එම ස්ථානවල සේවකයින් සහ ඊට ආසන්නව ජීවත්වන මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදිය යුතු වේ.

උස අඩි 30 ඉක්මවන සියළුම සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති පශ්චාත් ආපදා ගණයට අයත් පද්ධති වශයෙන් සැලසුම් කොට නිර්මාණය කළ යුතුය.

සියළුම නිර්මාණ සැලසුම්, ගොඩනැගිලි සැලසුම්වලට අදාල ඇඳීම් සහ යෝජනා, නිර්මාණ සැලසුම් පිළිබඳව විශේෂඥ දැනුමක් ලබා ඇති වරලත් සිවිල් ඉංජිනේරුවකු විසින් සහතික කළ යුතුය. සහතිකය ලබාදෙන ආයතන සහ පුද්ගලයන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වූවන් විය යුතුය.

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ඉදිකරනු ලබන කාලය තුල පූර්ණ රක්ෂණ ආවරණ සැලසිය යුතු වේ.

ඉදිකිරීම් අදියර තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ නිර්දේශ වලට අනුව ගුවන් යානා ආපදා සංඥා පද්ධතියක් සහිතව සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු සවි කළ යුතුය.

විදුලි සංදේශ යටිතල පහසුකම් සලසනු ලබන ආයතන විසින් නියමිත පළාත් පාලන බලධාරීන්ගෙන් එම පද්ධති ඉදිකිරීම සඳහා බලපත්‍ර ලබා ගත යුතුවේ. සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කරනු ලැබේ.

***ප්‍රතිපත්ති ප්‍රකාශය VII*** - ගොඩනැගිලි මත සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු සවි කිරීම.

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු සවි කිරීම සඳහා පහසුකම් සැලසීම හැරුණු විට මූලික වශයෙන් ගොඩනැගිලිවල ව්‍යුහාත්මක ස්ථායීතාවය තහවුරු වන පරිදි නිර්මාණ සැලසුම සකස්කර සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ඉදිකිරීම කළ යුතුවේ.

අනුමැතිය ලබා දීමට පෙර නිර්මාණ සැලසුම් පිළිබඳව විශේෂඥ දැනුමක් ලබා ඇති වරලත් සිවිල් ඉංජිනේරුවකු විසින් ඉදිකිරීම සහතික කළ යුතුය. ගොඩනැගිල්ලේ ආරක්ෂාව සහතික වන පරිදි අකුණු ආරක්ෂණ පද්ධතියක් සවිකළ යුතුය.

බිම් මට්ටමේ සිට සම්පූර්ණ උස ප්‍රමාණය මීටර 30 ට වැඩි සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති ගොඩනැගිලි මත සවි කිරීමේදී ඒවා පශ්චාත් ආපදා ගණයට අයත් නිර්මිතයන් වශයෙන් සැලසුම් කළ යුතුය.

ගොඩනැගිලි මත සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු සවිකිරීම අනෙකුත් ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි සිදු කළ යුතුය.

***ප්‍රතිපත්ති ප්‍රකාශය VIII*** - සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති නඩත්තු කිරීම.

ඉදිකරන ලද සියළුම සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති පිළිබඳව පූර්ණ දත්ත ගබඩාවක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නඩත්තු කාර්යයන් සම්බන්ධයෙන් පනවා ඇති මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදි සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පිළිබඳ නඩත්තු කාර්යයන් සිදු කළ යුතුය. සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති වලට ගුවන් අනතුරු සංඥා ලාම්පු සවිකිරීම සහ තීන්ත ආලේප කිරීම තුලින් දුරකථන කුළුණු ගුවන්යානා වලට පැහැදිලිව දර්ශණය වීමට කටයුතු කළ යුතුය. එම කටයුතු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිර්දේශවලට අනුව සිදුකළ යුතුය.

අකුණු ආරක්ෂණ පද්ධතිවල ක්‍රියාකාරීත්වය හා ඵලදායීතාවය පිළිබඳව භෞතික පරීක්ෂණ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

***ප්‍රතිපත්ති ප්‍රකාශය IX*** - සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතිවල ව්‍යුහාත්මක වෙනස්කිරීම්

මහජනතාව සහ දේපලවල සුරක්ෂිතභාවය සාක්ෂාත් කිරීම සඳහා සම්පූර්ණයෙන්ම හෝ කෙටි කාල පරිච්ඡේදයක් සඳහා වුවද සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති අත්හැර දැමිය යුතු නොවේ.

මෙහෙයුම් කටයුතු අත්හිටුවීමට බලාපොරොත්තුවන අවස්ථාවකදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව විදුලි සංදේශ යටිතල පහසුකම් සපයනු ලබන පාර්ශවයන් විසින් ඒ සඳහා නියමිත ක්‍රියාපටිපාටියක් අනුගමනය කොට මෙහෙයුම් කටයුතු හා විදුලි සංදේශ කුළුණ ඉවත් කිරීමේ කටයුතු අවසන් කළ යුතු වේ.

අනුමත සැලැස්මේ සඳහන් ක්‍රියාපටිපාටියෙන් පරිබාහිරව සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතියේ යම් වෙනස්කිරීම් සිදු කිරීමට අදහස් කරන්නේ නම්, නිර්මාණ සැලසුම් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති වරලත් සිවිල් ඉංජිනේරුවකුගේ සහතිකය ඒ සඳහා අවශ්‍ය වේ.

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතියක් ඉවත් කිරීමේදීද ඒ සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගත යුතුවන අතර, සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධතිය ඉවත් කිරීමේ කාලපරිච්ඡේදය තුල සිදුවිය හැකි අනතුරු සඳහා පූර්ණ රක්ෂණ ආවරණ ලබාගත යුතුය.

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| සී.ඒ.ඒ.එස්.එල්. | - | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| සී.ඊ.ඒ. | - | මධ්‍යම පරිසර අධිකාරිය |
| ඊ.එම්.සී. | - | විද්‍යුත් චුම්බක රශ්මිධාරා |
| ඊ.එම්.එෆ්. | - | විද්‍යුත් චුම්බක අනුකූලතාවය |
| අයි.සී.එන්.අයි.ආර්.පී. | - | අයනිකරණය නොවන තරංගපිළිබඳ ජාත්‍යන්තර කොමිෂන් සභාව |
| එල්.ඒ. | - | පළාත් පාලන ආඥා පනත යටතේ ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද පළාත් පාලන ආයතනය |
| එම්.සී. | - | මහනගර සභා ආඥා පනත යටතේ පිහිටුවන ලද මහනගර සභා |
| එම්.ඕ.ඩී. | - | රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය |
| පී.එස්. | - | ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභා |
| ආර්.එෆ්. | - | ගුවන් විදුලි තරංග |
| ටී.ඒ.සී. | - | තාක්ෂණික උපදේශන කමිටුව |
| ටී.ආර්.සී.එස්.එල්. | - | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
| ටී.අයි.එස්.පී. | - | විදුලි සංදේශ යටිතල සේවා පහසුකම් සැපයුම්කරු |
| ටී.එස්.පී. | - | විදුලි සංදේශ සේවා සැපයුම්කරු |
| යූ.සී. | - | නගර සභා ආඥා පනත යටතේ ලංකාවේ පිහිටුවන ලද නගර සභා |
| යූ..ඩී.ඒ. | - | නගර සංවර්ධන අධිකාරිය |
| ඩබ්ලිව්.එච්.ඕ. | - | ලෝක සෞඛ්‍යය සංවිධානය |

# අර්ථ නිරූපණය

**ඇන්ටෙනා** - විදුලි සංදේශ පණිවුඩ නිකුත් කිරීම සඳහා උපයෝගී කරගනු ලබන උපාංගයකි.

**ඇන්ටෙනා පද්ධතිය** - ඇන්ටෙනා පද්ධති සවිකරනු ලැබිය හැකි කොටස.

**ඇන්ටෙනා ස්මූත්වර් ෆාම්** - සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු සමූහයේ භූගෝලීය පිහිටීම.

**කැනොපි** - තුරුලතා වලින් සමන්විත වන වියන

**ටෙක්නිකල් ඇඩ්වයිසරි කොමිටි (ටී.ඒ.සී.)** -

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු පද්ධති ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබූ උපදේශක මණ්ලඩය

**ටෙලිකොමියුනිකේෂන් සර්විස් ප්‍රොවයිඩර් (ටී.එස්.පී.)** -

මහජනතාවට විදුලි සංදේශ සේවාවන් සපයනු ලබන පුද්ගලයා

**ටෙලිකොමියුනිකේෂන් ඉන්ප්‍රාස්ටක්චර් ප්‍රොවයිඩර් (ටී.අයි.එස්.පී.)** -

විදුලි සංදේශ යටිතල පහසුකම් සපයන පුද්ගලයා

සම්ප්‍රේෂණ (ඇන්ටෙනා) කුළුණු ස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ මෙම ප්‍රතිපත්ති සකස් කිරීමේදී අවධානය යොමු කලයුතු කරුණු පිළිබඳව අදහස් හා මත ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාව වෙත මෙයින් ඇරයුම් කෙරේ.

සියළුම මත ප්‍රකාශයන් සහ ගුණ දොස් විවේචන ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් (මයික්‍රෝ සොෆ්ට් වර්ඩ්ස්) මඟින් ඉදිරිපත් කළ යුතුය. ඔබේ ප්‍රතිචාරය පහත සඳහන් ලිපිනයට 2008 සැප්තැම්බර් 11 වන දිනට පෙර ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිමි.


විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක. 276, ඇල්විටිගල මාවත
කොළඹ 08.
ඊ මේල් - networkdata@trc.gov.lk
වෙබ් අඩවිය - www.trc.gov.lk


**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

2008 අගෝස්තු 11